JMC vLearning
"your virtual learning partner"

# මෙහෙයුම් ප්‍රකාශන

## AAT අදියර III
## MAF - කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
## Pack 02


උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# පරිච්ඡේදය 6

# මෙහෙයුම් ප්‍රකාශන
# (Operating Statements)

සියලුම විචලතා එක්ව ගෙන අයවැයගත ලාභය හා සත්‍ය ලාභය සසඳන ආකාරය මෙහෙයුම් ප්‍රකාශනයක් මගින් පෙන්වයි.

මේ දක්වා අප සලකා බලන ලද්දේ ඒ ඒ විචලතා වෙන වෙනම ගණනය කරන ආකාරය පිළිබඳව වන අතර, ඒවා එකතු වී, යම් කාලපරිච්ඡේදයක් සඳහා වූ සත්‍ය ලාභය හා අයවැයගත ලාභය අතර වෙනස සසඳන ආකාරය පිළිබඳව නොවේ. සාමාන්‍යයෙන් මෙම සැසඳීමේ ප්‍රකාශය, යම් පාලන කාලපරිච්ඡේදයක් අගදී ඉහළ කළමනාකරණයට ඉදිරිපත් කරන වාර්තාවක් ස්වරූපයෙන්, සකස් කෙරේ. මෙලෙස ඉදිරිපත් කරන වාර්තාව, **"මෙහෙයුම් ප්‍රකාශනයක්"** නැතහොත් **"විචලන වාර්තාවක්"** ලෙස හැඳින්වේ.

එනම් මෙහෙයුම් ප්‍රකාශනයක් යනු, සත්‍ය හා අයවැය සසඳා කළමනාකරණයට වාර්තා කරන ලේඛනයකි.

### 10.1 අන්තර්ග්‍රහණ පිරිවැය ක්‍රමය යටතේ මෙහෙයුම් ප්‍රකාශන (Operating Statements under Absorption Costing)

බොහෝ ප්‍රමිත පිරිවැයකරණ ක්‍රම පදනම් වන්නේ මුළු අන්තර්ග්‍රහණ පිරිවැය මූලධර්ම මතය. මෙම පරිච්ඡේදය තුළ මේ දක්වා සාකච්ඡා කළ ප්‍රමිත හා විචලතා අන්තර්ග්‍රහණ පිරිවැය ක්‍රමයට අදාල වේ.

(අන්තර්ග්‍රහණ පිරිවැයකරණ මූලධර්මය නැවත මතක් කර ගැනීමට අවශ්‍ය නම්, ඉහත 07 වන පරිච්ඡේදය බලන්න.)

## Eg: විස්තරාත්මක නිදසුන

සීමිත HEC කොමරෝස් සමාගම (HEC Com) තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන අතර, නිමවූ විගසම සමස්ථ නිෂ්පාදනයම අලෙවි කෙරේ. ආරම්භක හෝ අවසාන අමුද්‍රව්‍ය සහ නිමි තොග නොමැති අතර නොනිමි තොග ද නොසැලකිය හැකි තරම් වේ. HEC තුළ ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර, මාසික පදනම මත විචලතා විශ්ලේෂණය කරනු ලබයි. Fishing hook (බිලි පෙති) නම් වූ භාණ්ඩ ඒකකයකට අදාළ ප්‍රමිත පිරිවැය පත්‍රිකාව පහත පරිදි විය.

**Fishing hook ඒකකයක් සඳහා**
**ප්‍රමිත පිරිවැය පත්‍රය**

| | රු. |
|---|---|
| සෘජු ද්‍රව්‍ය (කිලෝ 0.5 @ රු. 4) | 2.00 |
| සෘජු ශ්‍රමය (පැය 2 @ රු. 8) | 16.00 |
| විචල්‍ය පො/කා. (පැය 2 @ රු. 0.30) | 0.60 |
| ස්ථාවර පො/කා. | 7.40 |
| ප්‍රමිත පිරිවැය | 26.00 |
| ප්‍රමිත ලාභය | 6.00 |
| ප්‍රමිත මිල | 32.00 |

## සටහන :

විකුණුම් හා පරිපාලන වියදම් ප්‍රමිත පිරිවැය පත්‍රය තුළට ඇතුලත් නොකරන අතර, ඒවා කාල පිරිවැය සේ සලකා ලාභාලාභ ගිණුමට කපා හැරේ.

අයවැයගත විකුණුම් හා පරිපාලන වියදම් රු. 20,400 කි. 2020 දෙසැම්බර් මාසය සඳහා අයවැයගත නිෂ්පාදනය හා විකුණුම් ඒකක ගණන 5,100 කි.

2020 දෙසැම්බර් මාසය සඳහා සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| ඒකක 4,850 ක විකුණුම් වටිනාකම | රු. 150,350 |
| නිෂ්පාදනය සඳහා භාවිත කළ ද්‍රව්‍ය | කිලෝ 2,300 ක් රු. 9,800 |
| ගෙවූ ශ්‍රමය | පැය 8,500 ක්, රු. 67,800 |
| දරන ලද විචල්‍ය පොදුකාර්ය | රු. 2,600 |
| දරන ලද ස්ථාවර පොදුකාර්ය | රු. 42,300 |
| දරන ලද විකුණුම් හා පරිපාලන පොදුකාර්ය | රු. 18,000 |

පහත දෑ ඔබ විසින් කළ යුතු වේ.

(1) සියලුම විචලතා ගණනය කිරීම.
(2) 2020 දෙසැම්බර් මාසය සඳහා, අන්තර්ග්‍රහණ ක්‍රමයට මෙහෙයුම් ප්‍රකාශණයක් සකස් කිරීම.

## පිළිතුර

**(1) විචලතා**

(a) අමු. මිල විචලතාව = මිලට ගත් ඒකක (ප්‍රමිත මිල - සත්‍ය මිල)

$$= 2{,}300 \left(4 - \frac{9{,}800}{2{,}300}\right)$$

= (600) අවාසි

(b) අමු. භාවිත විචලතාව = ප්‍රමිත මිල (ප්‍රමිත භාවිතය - සත්‍ය භාවිතය)
= 4 ( 4,850 x 0.5 – 2,300 )
= 500 වාසි

(c) ශ්‍රම. අනුපාත විචලතාව = ගෙවූ පැය (පැයක ප්‍රමිත වැටුප - පැයක සත්‍ය වැටුප)

$$= 8{,}500 \left(8 - \frac{67{,}800}{8{,}500}\right)$$

= 200 වාසි

(d) ශ්‍රම. කාර්යක්ෂමතා විචලතාව = ප්‍රමිත රේටය (ප්‍රමිත පැය - වැඩකළ පැය)
= 8 ( 4,850 x 2 - 8,500 )
= 9,600 වාසි

(e) වි/පො/කා. වියදම් විචලතාව = ඉඩදිය හැකි වියදම - සත්‍ය වියදම
= 0.30 x 8,500 – 2,600
= (50) අවාසි

(f) වි/පො/කා. කාර්යක්ෂමතා විචලතාව = පැයක අන්තර් (ප්‍රමිත පැය - වැඩ කළ පැය)
= 0.30 ( 4,850 x 2 – 8,500 )
= 360 වාසි

(g) ස්ථා. පො/කා. වියදම් විචලතාව = අයවැයගත වියදම - සත්‍ය වියදම
= 5,100 x 7.40 – 42,300
= (4,560) අවාසි

(h) ස්ථා. පො/කා පරිමා විචලතාව = පැයක අන්තර් (ප්‍රමිත පැය - අයවැයගත පැය)

හෝ

ස්ථා. පො.කා. පරිමා විචලතාව = ප්‍රමිත ස්ථා. පො/කා. - අයවැයගත ස්ථා. පො/කා.
= 7.40 x 4,850 – 5,100 x 7.40
= (1,850) අවාසි

(i) විකුණුම් මිල ආන්තික විචලතාව = විකිණි ඒකක (සත්‍ය මිල - අයවැයගත මිල)
= 4,850 ( 31 – 32 )
= (4,850) අවාසි

(j) විකුණුම් පරිමා ආන්තික විචලතාව = ඒකක අයවැයගත ලාභය (සත්‍ය විකුණුම් ඒකක - අයවැයගත විකු. ඒකක)
= 6 ( 4,850 – 5,100 )
= (1,500) අවාසි

(k) මුළු විකුණුම් හා පරිපාලන වියදම් විචලතාව = අයවැයගත - සත්‍ය
= 20,400 – 18,000
= 2,400 වාසි

- විකුණුම් හා පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය නොකරන නිසා, ගණනය කළ යුත්තේ වියදම් විචලතාව පමණි.

**(2)** **සීමිත HEC Com සමාගම**

2020 දෙසැම්බර් සඳහා - මෙහෙයුම් ප්‍රකාශනය

**(අන්තර්ග්‍රහණ ක්‍රමය)** **රු.**

| | | | |
|---|---|---|---|
| **විකු. හා පරි. වියදම් වලට පෙර අයවැයගත ලාභය (6 x 5,100)** | | | 30,600 |
| **(-) අයවැයගත විකුණුම් හා පරිපාලන වියදම්** | | | (20,400) |
| **මාසය සඳහා අයවැයගත ලාභය** | | | 10,200 |
| **විචලතා :** | **වාසි** | **අවාසි** | |
| | **රු.** | **රු.** | |
| අමුද්‍රව්‍ය මිල | - | 600 | |
| අමුද්‍රව්‍ය භාවිත | 500 | - | |
| ශ්‍රම. අනුපාත | 200 | - | |
| ශ්‍රම. කාර්යක්‍ෂමතා | 9,600 | - | |
| විචල්‍ය පොදුකාර්ය වියදම් | - | 50 | |
| විචල්‍ය පොදුකාර්ය කාර්යක්‍ෂමතා | 360 | - | |
| ස්ථාවර පොදුකාර්ය වියදම් | - | 4,560 | |
| ස්ථාවර පොදුකාර්ය පරිමා | - | 1,850 | |
| විකුණුම් - මිල ආන්තික | - | 4,850 | |
| විකුණුම් - පරිමා ආන්තික | - | 1,500 | |
| විකුණුම් හා පරිපාලන - වියදම් | 2,400 | - | |
| | 13,060 | 13,410 | (350) |
| මාසය සඳහා සත්‍ය ලාභය | | | 9,850 |

| | | |
|---|---|---|
| **නිවැරදිතාව පරීක්‍ෂා කිරීම :** | **රු.** | **රු.** |
| **සත්‍ය විකුණුම්** | | 150,350 |
| **(-) සත්‍ය පිරිවැය :** | | |
| ද්‍රව්‍ය | 9,800 | |
| ශ්‍රමය | 67,800 | |
| විචල්‍ය පොදුකාර්ය | 2,600 | |
| ස්ථාවර පොදුකාර්ය | 42,300 | |
| විකුණුම් හා පරිපාලන | 18,000 | (140,500) |
| ∴ සත්‍ය ලාභය | | 9,850 |

## 10.2 ආන්තික පිරිවැය ක්‍රමය යටතේ මෙහෙයුම් ප්‍රකාශන
**(Operating Statements under Marginal Costing)**

07 වන පරිච්ඡේදය තුළ ආන්තික පිරිවැයකරණ ක්‍රමය විස්තරාත්මකව සාකච්ඡා කර ඇත. (මෙම කොටස අධ්‍යයනය කිරීමට පෙර එම පරිච්ඡේදයේ අදාල කොටස කියවන්න)

ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමයක්, ආන්තික පිරිවැයකරණ ක්‍රමයක් තුළ ද ක්‍රියාත්මක විය හැක. එවිට එය "ප්‍රමිත ආන්තික පිරිවැයකරණය" නැතහොත් "ප්‍රමිත විචල්‍ය පිරිවැයකරණය" ලෙස ද හැඳින්වේ.

ආන්තික පිරිවැයකරණයේදී පිරිවැය බෙදා වෙන්කරනුයේ "විචල්‍ය" සහ "ස්ථාවර" ලෙස පමණි. ස්ථාවර පිරිවැය, නිෂ්පාදන ඒකක වලට අන්තර්ග්‍රහණය නොකරන අතර, ඒ වෙනුවට මුළු ප්‍රමාණයම ලාභය ගණනයේදී දායකයෙන් අඩු කෙරේ.

ප්‍රමිත ආන්තික පිරිවැයකරණ ක්‍රමයක් තුළ පහත ලක්ෂණ ද දැකිය හැක.

(1) අන්තර්ග්‍රහණ ක්‍රමයේදී මෙන්ම මෙහිදී ද සාමාන්‍ය පරිදි ප්‍රමිත සකස් කෙරේ.
(2) ප්‍රමිත පිරිවැය පත්‍රය තුළ ස්ථාවර පිරිවැය ඇතුලත් නොවේ.
(3) අයවැයගත ලාභය වෙනුවට, අයවැයගත දායකය ගණනය කෙරේ.
(4) අයවැයගත ලාභ ප්‍රකාශනය පහත ආකෘතියෙන් පිළියෙල කෙරේ.

| | | |
|---|---|---|
| | අයවැයගත විකුණුම් | XX |
| (-) | අයවැයගත විචල්‍ය විකුණුම් පිරිවැය | (XX) |
| | මුළු අයවැයගත දායකය | XX |
| (-) | අයවැයගත ස්ථාවර පිරිවැය | (XX) |
| | ∴ අයවැයගත ලාභය | XX |

(5) **විචලතා :**
ස්ථාවර පොදුකාර්ය පිරිවැය විචලතා හා විකුණුම් ආන්තික විචලතා හැර අනෙකුත් සියලුම විචලතා අන්තර්ග්‍රහණ ක්‍රමයට සමාන වේ.

- සෘජු ද්‍රව්‍ය
- සෘජු ශ්‍රමය
- විචල්‍ය පොදුකාර්ය

} විචලතා අන්තර්ග්‍රහණ ක්‍රමයේදී මෙන් සකස් කෙරේ

- ස්ථාවර පොදුකාර්ය → සකස් කරනුයේ වියදම් විචලතාව පමණි

- විකුණුම් විචලතා :
  - මුළු විකුණුම් ආන්තික විචලතාවය වෙනුවට මුළු විකුණුම් දායක විචලතාවය සකස් කෙරේ.
  - මිල විචලතාව වෙනසක් නොවේ.
  - විකුණුම් පරිමා ආන්තික විචලතාවය වෙනුවට විකුණුම් දායක පරිමා විචලතාව සකස් කෙරේ.

## Eg: උදාහරණ

ඉහත HEC කොමරෝස් (HEC Com) නිදසුන සඳහා නැවත යොමු වුවහොත්, ප්‍රමිත ආන්තික පිරිවැයකරණයක් යටතේ සංශෝධනය වන විචලතා පහත පරිදි වේ.

- ස්ථා. පො/කා. වියදම් විචලතාව = අයවැයගත වියදම - සත්‍ය වියදම
  = 5,100 x 7.40 – 42,300
  = <u>(4,560) අවාසි</u>

- විකුණුම් දායක පරිමා විචලතාව = ප්‍රමිත දායකය (සත්‍ය විකුණුම් ඒකක - අයවැයගත විකු. ඒකක)
  = 13.40 ( 4,850 – 5,100 )
  = <u>(3,350) අවාසි</u>

| | |
|---|---|
| **පෙරවැඩ :** | **රු.** |
| අයවැයගත / ප්‍රමිත විකුණුම් මිල | 32 |
| (-) ප්‍රමිත විචල්‍ය පිරිවැය ( 2 + 16 + 0.60 ) | 18.60 |
| ප්‍රමිත / අයවැයගත ඒකක දායකය | 13.40 |
| ∴ මුළු අයවැයගත දායකය ( 13.40 x 5,100) | Rs. 68,340 |

**සීමිත HEC Com සමාගම**

**2014 දෙසැම්බර් සඳහා - මෙහෙයුම් ප්‍රකාශනය**

**(ආන්තික ක්‍රමය)**

| | | | රු. |
|---|---|---|---|
| **මුළු අයවැයගත දායකය** | | | 68,340 |
| **(+ / -) විචලතා :** | **වාසි** | **අවාසි** | |
| | **රු.** | **රු.** | |
| අමුද්‍රව්‍ය මිල | - | 600 | |
| අමුද්‍රව්‍ය භාවිත | 500 | - | |
| ශ්‍රම අනුපාත | 200 | - | |
| ශ්‍රම කාර්යක්ෂමතා | 9,600 | - | |
| විචල්‍ය පොදුකාර්ය වියදම් | - | 50 | |
| විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා | 360 | - | |
| විකුණුම් - මිල ආන්තික | - | 4,850 | |
| විකුණුම් - දායක පරිමා | - | 3,350 | |
| | 10,660 | 8,850 | 1,810 |
| මුළු සත්‍ය දායකය | | | 70,150 |
| අයවැයගත ස්ථාවර පිරිවැය | | 37,740 | |
| (+) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලතාව | | 4,560 | |
| ∴ සත්‍ය ස්ථාවර පොදුකාර්ය | | 42,300 | (42,300) |
| අයවැයගත විකුණුම් හා පරිපාලන පිරිවැය | | 20,400 | |
| (-) විකුණුම් හා පරිපාලන වියදම් විචලතාව | | (2,400) | (18,000) |
| ∴ සත්‍ය ලාභය | | | 9,850 |

## වැදගත් සටහනක්!

ඉහත ක්‍රම දෙක යටතේම ගණනය කළ ලාභ අතර වෙනසක් නොමැති බව ඔබට නිරීක්ෂණය කළ හැක. තොග නොමැති නිසා (හෝ ආරම්භක තොග හා අවසාන තොග සමාන නම්) මෙය සිදු වේ. නමුත් එසේ නොවන විට මෙම ක්‍රම දෙක මගින් ජනනය කරන ලාභ අතර වෙනසක් ඇති වේ.

# ස්ථාවර සහ නම්‍ය අයවැය (Fixed and Flexible Budgets)

## 10.3 ස්ථාවර අයවැය (Fixed Budget)

සත්‍ය වශයෙන් ළඟා කරගත් නැතහොත් අත්පත් කරගත් මට්ටම කුමක් වුවත්, වෙනස් නොවී පවත්වා ගැනීම සඳහා සකස් කරන අයවැය මෙය වේ. මෙය තනි නිමවුම් මට්ටමක් මත පදනම් වේ. නිෂ්පාදන මට්ටම වෙනස් වීමට අනුකූලව, ස්ථාවර අයවැය වෙනස් නොවේ. මෙය සකස් කරනුයේ සැලසුම් කිරීමේ පරමාර්ථයෙන් නිසා, මෙය "සැලසුම් අයවැයක්" ලෙස හැඳින්වේ.

### Eg: උදාහරණ

XYZ සමාගම පාරිභෝගික භාණ්ඩයක් නිෂ්පාදනය කර විකුණන අතර, දෙසැම්බර් මාසය සඳහා සත්‍ය දත්ත හා අයවැයගත දත්ත සමග කළ සැසඳීමක් පහත ඉදිරිපත් කෙරේ.

දෙසැම්බර් මාසය සඳහා මෙහෙයුම් ප්‍රකාශය

| | සත්‍ය | අයවැය | විචලනය | |
|---|---|---|---|---|
| නිෂ්පාදන / විකුණුම් ඒකක | 1,000 | 1,500 | (500) | |
| | රු. | රු. | රු. | |
| සෘජු ද්‍රව්‍ය | 12,000 | 15,000 | 3,000 | F |
| සෘජු ශ්‍රමය | 17,780 | 24,000 | 6,220 | F |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය | 14,230 | 21,900 | 7,670 | F |
| ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය | 11,000 | 12,000 | 1,000 | F |
| ස්ථාවර පරිපාලන පොදුකාර්ය | 13,200 | 12,900 | (300) | A |
| විචල්‍ය විකුණුම් හා බෙදාහැරීම් පොදුකාර්ය | 5,680 | 8,400 | 2,720 | F |
| ස්ථාවර විකුණුම් හා බෙදාහැරීම් පොදුකාර්ය | 6,330 | 9,000 | 2,670 | F |

F = වාසි විචලතා (Favourable Variance)
A = අවාසි විචලතා (Adverse Variance)

යම්කිසි කාලපරිච්ඡේදයක් සඳහා වූ අයවැයගත දත්ත සමග සත්‍ය දත්ත සැසඳීම කරන විට, එය වලංගු සැසඳීමක් බවට කළමනාකරණය තහවුරු කළ යුතු වේ. කෙසේ වුවත්, මෙම පරමාර්ථය සඳහා ප්‍රායෝගිකව ස්ථාවර අයවැය භාවිත කරනුයේ කලාතුරකිනි. ඇතැම් විට කොහොත්ම භාවිත නොවේ. ඉහත මෙහෙයුම් ප්‍රකාශනයෙන් පෙන්වා ඇති පරිදි, ඒ සඳහා ප්‍රධානම හේතුව වන්නේ සත්‍ය නිමවුම ප්‍රමාණාත්මක ලෙස අයවැයගත නිමවුමෙන් වෙනස් වීමයි. එවැනි අවස්ථාවකදී, සැසඳීමේ හා පාලන පරමාර්ථය සඳහා අයවැය භාවිත කළ නොහැක.

එවිට මෙහෙයුම් වාර්තාව හෙවත් කාර්යයඵල වාර්තාව නොමග යවන සුළු එකක් විය හැකි අතර එමගින් වලංගු සැසඳීමක් සිදු නොවේ. එනම් ඒ තුළ වලංගු තොරතුරු අඩංගු නොවේ. නිදසුනක් ලෙස, ඉහත XYZ සමාගම් නිදසුනේ, අයවැයගත කළ ඒකක 1,500 වෙනුවට සත්‍ය වශයෙන්, නිෂ්පාදනය කර ඇත්තේ, ඒකක 1,000 ක් පමණි. එමනිසා ඒකක 1,000 ක් සඳහා දරා ඇති සත්‍ය පිරිවැය, ඒකක 1,500 ක් සඳහා අයවැයගත කළ සංඛ්‍යා සමග සැසඳීම කළ නොහැක.

ස්ථාවර අයවැය යටතේ සකස් කර ඇති මෙහෙයුම් වාර්තාව මගින් හෙළිදරව් කරනුයේ සත්‍ය පිරිවැය, අයවැයගත පිරිවැයට වඩා අඩු ද හෝ වැඩි ද යන්න පිළිබඳව පමණි. එමනිසා සත්‍ය නිමවුම, අයවැය ගත නිමවුමෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට, ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කිරීමට ස්ථාවර අයවැය අපොහොසත් වේ.

එසේනම්, ඉහත සැසඳීම හා ඒ තුළින් හඳුනාගන්නා විචලතා තාත්වික හා තාර්කික නොවේ. එය නිවැරදි සැසඳීමක් වීමට නම්, සත්‍ය ප්‍රතිඵල සැසඳිය යුත්තේ, එම මට්ටමට ගලපා සකස් කළ අයවැයක් සමග වේ. එනම් සත්‍ය මට්ටමට ගලපා ගනිමින් සකස් කළ නම්‍ය අයවැයක් සමග වේ. නිදසුනක් ලෙස, ඉහත XYZ සමාගම් නිදසුනේ ඒකක 1,500 ක් වෙනුවෙන් සකස් කළ මූලික අයවැය, සත්‍ය මට්ටමක වන ඒකක 1,000 ට අදාළව ගලපා සකස් කළ යුතුය. (එනම් ඒකක 1,000 ට අදාළ වන නම්‍ය අයවැය)

### 10.4 නම්‍ය අයවැය (Flexible Budget)

නම්‍ය අයවැයක්, වලංගු හා තාත්වික සැසඳීමක් කිරීම සඳහා කළමනාකරණයට සහාය වේ.

ක්‍රියාකාරකම් මට්ටම් දෙකක් සඳහා හෝ වැඩි ගණනක් සඳහා සකස් කරන පාලන අයවැයක් ලෙස නම්‍ය අයවැය හැඳින්විය හැක. වෙනස් වූ අපේක්ෂිත ක්‍රියාකාරකම් මට්ටම් කීපයක් සඳහා සකස් කරන විකල්ප අයවැය සමූහයක් වේ.

නම්‍ය අයවැය ලේඛනය, චාලක අයවැය (Dynamic Budget), වියදම් පාලන අයවැය (Expenses Control Budget) ලෙසටද හඳුන්වයි. මෙය පදනම් වන මූලධර්මය වන්නේ, "සෑම ව්‍යාපාරයක්ම ක්ෂණිකව වෙනස්වන බවත්, සෑමදාම වෙනස්වන බවත් කිසිවිටෙකත් ස්ථාවරව නොපතින බවත්ය." ස්වයංක්‍රීයව එය සත්‍ය මට්ටමට අනුව හැඩ ගැසෙන නැතහොත් වෙනස්වන නිසා, සැසඳීමේ කාර්යය සඳහා එමගින් විශ්වාසදායී හා තාත්වික පදනමක් සපයනු ලැබේ.

නම්‍ය අයවැයක් සකස් කිරීමට පෙර, කළමනාකරණය විසින් කළ යුතු කාර්යයක් වන්නේ කුමන පිරිවැය විචල්‍යද? කුමන ඒවා ස්ථාවරද? යන්න හඳුනා ගැනීමයි. විචල්‍ය පිරිවැයන් අදාළ ක්‍රියාකාරකම් මට්ටමට ගලපා සකස් කර ගත යුතු අතර, මට්ටම කුමක් වුවත් ස්ථාවර පිරිවැයන් වෙනස් නොකර භාවිත කළ යුතු වේ.

## Eg: උදාහරණ

ඉහත XYZ සමාගම් නිදසුනම ගතහොත්,

දෙසැම්බර් මාසය සඳහා - මෙහෙයුම් ප්‍රකාශය (නම්‍ය)

| | ඒකක 1,000 ක් සඳහා නම්‍ය අයවැය | සත්‍ය | විචලතාව | |
|---|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | $15,000 \times \frac{1,000}{1,500} = 10,000$ | 12,000 | (2,000) | A |
| සෘජු ශ්‍රමය | $24,000 \times \frac{1,000}{1,500} = 16,000$ | 17,780 | (1,780) | A |
| විචල්‍ය නිෂ්පාදන පො/කා | $21,900 \times \frac{1,000}{1,500} = 14,600$ | 14,230 | 370 | F |
| ස්ථාවර නිෂ්පාදන පො/කා | = 12,000 | 11,000 | 1,000 | F |
| ස්ථාවර පරිපාලන පො/කා | = 12,900 | 13,200 | (300) | A |
| විචල්‍ය විකු. හා බෙදා. පො/කා | $8,400 \times \frac{1,000}{1,500} = 5,600$ | 5,680 | (80) | A |
| ස්ථාවර විකු. හා බෙදා. පො/කා | = 9,000 | 6,330 | 2,670 | F |

F = වාසි (Favourable Variance)
A = අවාසි (Adverse Variance)

ඉහත සංශෝධනය කර ඇති සැසඳීම හොඳින් නිරීක්ෂණය කළේනම්, මුලදී වැරදි සහගත අයුරින් වාසි විචලතා ලෙස හඳුනාගත් ඇතැම් විචලතා නිවැරදිව හඳුනාගත් විට අවාසි විචලතා වී ඇත. එහෙයින්, ඉහතදී ස්ථාවර අයවැය සමග කළ සැසඳීමට සාපේක්ෂව ගත්විට, නම්‍ය අයවැයක් මගින් වලංගු සැසඳීමක් කළ හැකි වේ.

### 10.4.1 නම්‍ය අයවැයකරණයේ පියවරයන් (Steps)

නම්‍ය අයවැයක් සකස් කිරීමේදී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු වේ.

(1) අයවැය සකස් කළ යුතු ක්‍රියාකාරකම් පරාසයන් තීරණය කරන්න.

(2) අයවැය තුළ ඇතුලත් කරන ඒ ඒ පිරිවැය මූලිකාංගයට අදාළ පිරිවැය හැසිරීම් රටාව තීරණය කරන්න.
එනම්; ස්ථාවර, විචල්‍ය හෝ අර්ධ විචල්‍ය

(3) අයවැය සකස් කළ යුතු ක්‍රියාකාරකම් මට්ටම් තීරණය කරන්න. එම මට්ටම්, නිෂ්පාදන ඒකක, යන්ත්‍ර පැය ධාරිතාව, ශ්‍රම පැය ධාරිතාව වැනි යමක් විය හැක.

(4) අදාළ වන පිරිවැය සම්බන්ධ කරමින්, ඒ ඒ මට්ටම සඳහා අයවැය සකස් කරන්න.

### 10.4.2 නම්‍ය අයවැයෙහි වාසි (Advantages)

නම්‍ය අයවැයක පහත සඳහන් වාසි නැතහොත් ප්‍රයෝජන ඇත.

(1) ධාරිතා සාධකයට වැඩි සැලකිල්ලක් දෙන නිසා, නිවැරදි අයවැයකරණයකට එමගින් පහසුව සලසයි.

(2) ළඟාකරගත් නිමවුම සඳහා කාර්යඵල මැනීමත්, සැසඳීම් කිරීමත් එමගින් සිදුවේ.

(3) පිරිවැය විචලතා විශ්ලේෂණය කිරීමටත්, එම විචලතා වලට අදාළව වගකීම් පැවරීමටත් හැකිවන පාලන උපකරණයක් ලෙස පහසුකම් සලසයි.